# පාර්ලිමේන්තු විත්ති

පුවත් හසුන | 28 වැනි කාණ්ඩය | ඔක්තෝබර් 2022



## ගිරිඋල්ල කලාපීය ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ මංගල රැස්වීම පාර්ලිමේන්තුවේ සහකාර මහ ලේකම්තුමාගේ සහභාගීත්වයෙන් ආරම්භ කෙරේ...

ගිරිඋල්ල කලාපයීය ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ පළමු සභාවාරයේ මංගල රැස්වීම ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සහකාර මහ ලේකම් ටිකිරි කේ.ජයතිලක මහතාගේ සහභාගීත්වයෙන් මේ මස 24 වැනිදා ගිරිඋල්ල වික්‍රමශීලා ජාතික පාසල් ශ්‍රවණාගාරයේදී පැවැත්විණි.








සන්නිවේදන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

# අන්තර්ගතය

## පුවත්

- නෙදර්ලන්ත තානාපතිනිය ගරු කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතා හමුවෙයි...

## විශේෂාංග

■ තොරතුරු පනතේ ක්‍රියාකාරීත්වය (2017 - 2021) ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව ආශ්‍රයෙන් සාකච්ඡා කිරීම

02 කොටස

## පාර්ලිමේන්තු විදු පියසෙන්

- ගිරිඋල්ල කලාපයීය ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ පළමු සභාවාරයේ මංගල රැස්වීම ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සහකාර මහ ලේකම් ටිකිරි කේ . ජයතිලක මහතාගේ සහභාගීත්වයෙන් මේ මස 24 වැනිදා ගිරිඋල්ල වික්‍රමශිලා ජාතික පාසල් ශ්‍රවණාගාරයේදී පැවැත්විණ
- ශිෂ්‍ය පාර්ලිමේන්තුවල විද්‍යුත් ඡන්ද ක්‍රමය ස්ථාපිත කිරීම සඳහා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සහාය
- පාර්ලිමේන්තුව සහ කොළඹ විශ්ව විද්‍යාලය එක්ව ආරම්භ කළ කෙටි කාලීන පාඨමාලාවේ පළමු අදියර සාර්ථකව අවසන් වෙයි
- කොළඹ 04 මුස්ලිම් කාන්තා විදුහල සිසුවියන් සඳහා පාර්ලිමේන්තුවෙන් විදු පියස වැඩසටහනක්
- පාර්ලිමේන්තු විවාද නැරඹීම සඳහා පාසල් සිසුන්ට යළි අවස්ථාව



## කාරක සභා පුවත්

- නවැනි පාර්ලිමේන්තුවේ වෘත්තීය පුහුණු ආයතන සමග ඒකාබද්ධව පුහුණු ශ්‍රමිකයන් වැඩි වශයෙන් විදේශ රැකියා සදහා යොමු කිරීමට වඩාත් කාර්යක්ෂම වැඩපිළිවෙළක් ...
- විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සඳහා ජාතික ප්‍රතිපත්තියක් සැකසීම සඳහා අවධානය.
- රට තුළ නිශ්චිත සහල් සංචිත පවත්වා ගත නොහැකිවීම පිළිබඳ කෝපා කමිටුවේ අවධානය.
- මෙරට ව්‍යවසායකත්වය සදහා පවතින බාධක ඉවත්කිරීම සඳහා නව ප්‍රතිපත්තිමය රාමුවක් - ජාතික සභා ප්‍රතිපත්ති සම්පාදන අනු කමිටුවෙන් නිර්දේශ.
- බලශක්ති ක්ෂේත්‍රයේ ප්‍රතිව්‍යුහගත කිරීම්වලට අදාළ කමිටු වාර්තාව සති දෙකක් තුළ ජාතික සභාවට ඉදිරිපත් කිරීමට පියවර.
- රාජ්‍ය ආයතනවල කාර්යසාධනය මැනීමට ප්‍රධාන කාර්ය දර්ශක (KPI) හඳුන්වා දීමට නව ප්‍රතිපත්ති සම්පාදනය කෙරේ.
- නිසි පෝෂණය සහිත ආහාර වේලක් ලැබෙන ප්‍රමාණය රටේ ජනතාවගෙන් 1/5ක් පමණයි.
- ෆේස්බුක් ඔස්සේ මන්ත්‍රී වරප්‍රසාද කඩකළ බව පිළිගත් පුද්ගලයා ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාව ඉදිරියේ සමාව ගනියි.

## කවරයේ කතාව

## පාර්ලිමේන්තු ඡායා ගැලරිය

# කවරයේ කතාව




## ගිරිඋල්ල කලාපීය ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ මංගල රැස්වීම පාර්ලිමේන්තුවේ සහකාර ලේකම්තුමාගේ සහභාගීත්වයෙන් ආරම්භ කෙරේ...

ගිරිඋල්ල කලාපයීය ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ පළමු සභාවාරයේ මංගල රැස්වීම ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සහකාර මහ ලේකම් ටිකිරි කේ. ජයතිලක මහතාගේ සහභාගීතිවයෙන් මේ මස 24 වැනිදා ගිරිඋල්ල වික්‍රමශීලා ජාතික පාසැල් ශ්‍රවණාගාරයේදී පැවැත්විනි.

පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙත ප්‍රජාතන්ත්‍රවාදය, වගකීම සහ වගවීම මෙන්ම ඡන්දය භාවිත කිරීමේ වැදගත්කම සම්බන්ධව ප්‍රායෝගික අවකාශය මෙරට පාසල් ප්‍රජාව වෙත විවර කර දීම ශිෂ්‍ය පාර්ලිමේන්තු සංකල්පයේ අරමුණයි.

ප්‍රජාතන්ත්‍රවාදී ජීවන ක්‍රමයක අත්දැකීම් පාසැල් ශිෂ්‍ය - ශිෂ්‍යාවන්ට සමීපස්ථ කරමින් මෙදින ගිරිඋල්ල කලාපයීය ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ පළමු සභාවාරයේ මංගල රැස්වීම අභිමානවත් අයුරින් පැවැත්විණි මෙම රැස්වීමේදී එම කලාපයේ මන්ත්‍රීවරයන් අතරින් කථානායකවරයා තෝරා පත් කර ගැනීම සිදු කෙරිණි. එයට අමතරව පැමිණි මන්ත්‍රීවරයන් අතරින් නියෝජ්‍ය කථානායක ,නියෝජ්‍ය කාරක සභා සභාපති තෝරා පත් කරගත් අතර ඉන් පසුව ගරු කථානායකතුමා ඉදිරියේ සියලු මන්ත්‍රීවරයන් සිය දිවුරුම හෝ ප්‍රතිඥාව ලබාදීම සිදු විය. මෙම අවස්ථාවට ගිරිඋල්ල අධ්‍යාපන කලාපයේ පාසල් තිහකට අධික සංඛ්‍යාවක ශිෂ්‍ය නියෝජිතයන් විෂය භාර ආචාර්යවරුන් සහ දෙමව්පියන් සහභාගී වූහ.

# පුවත්




# නෙදර්ලන්ත තානාපතිනිය ගරු කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතා හමුවෙයි...

නෙදර්ලන්ත තානාපතිනිය බොනී හෝබැක් මහත්මිය මේ මස 05 වැනිදා පාර්ලිමේන්තුවේ දී කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා හමුවූවා ය.

පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම් කුෂානි රෝහණදීර මහත්මිය ද මේ අවස්ථාවට එක්ව සිටියා ය.

නෙදර්ලන්ත කෞතුකාගාරවල ප්‍රදර්ශනය සඳහා තබා ඇති මෙරට කෞතුක වස්තු යළි ශ්‍රී ලංකාවට ගෙන ඒමේ අපේක්ෂාවක් පවතින බවද තානාපතිනිය මෙහිදී සඳහන් කළා ය. තව ද දෙරට අතර සංචාරක ව්‍යාපාරය දියුණු කිරීම පිළිබඳව ද ද්විපාර්ශවීය සබඳතා විවිධ අංශවලින් තවදුරටත් වර්ධනය කර ගැනීම පිළිබඳව ද සාකච්ඡා කෙරිණි.



# පාර්ලිමේන්තු විදු පියසෙන්

# ශිෂ්‍ය පාර්ලිමේන්තුවල විද්‍යුත් ඡන්ද ක්‍රමය ස්ථාපිත කිරීම සඳහා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සහාය









රට පුරා ක්‍රියාත්මක වන ශිෂ්‍ය පාර්ලිමේන්තු තුළ විද්‍යුත් ඡන්ද ප්‍රකාශ කිරීමේ ක්‍රමය ස්ථාපනය කිරීම සඳහා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව සිය සහයෝගය පළ කොට තිබේ .

එහි ආරම්භය ලෙස දැනුවත් කිරීමේ වැඩසටහනක් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් පසුගියදා පවත්වන ලද්දේ ඇහැලියගොඩ ජාතික පාසැලේ ශිෂ්‍ය පාර්ලිමේන්තු මැතිවරණය සඳහා විද්‍යුත් ඡන්ද ප්‍රකාශනය කිරීමේ ක්‍රමය භාවිතයට ගැනීම පිළිබඳව ය .

"ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ විද්‍යුත් ඡන්ද ප්‍රකාශනයට අත්වැලක්" මැයෙන් පැවති මෙම දැනුවත් කිරීමේ වැඩසටහනට ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ඉහළ නිලධාරීන් රැසක් සහභාගී වූ අතර එහිදී ශිෂ්‍ය-ශිෂ්‍යාවන්ට සහ ආචාර්යවරුන්ට සිය අදහස් සහ යෝජනා ඉදිරිපත් කිරීමටද අවස්ථාව හිමි විය .

ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා විද්‍යුත් යන්ත්‍රයක් භාවිත කිරීමෙන් මුද්‍රිත ඡන්ද පත්‍රිකා ඡන්ද පෙට්ටි යනාදිය සඳහා වන පිරිවැය ඉතිරි වන අතර ඡන්ද ගණනය සඳහා වැයවන ශ්‍රමය සහ කාලය ද අවම කරගත හැකි බව නූතන මැතිවරණ විශේෂඥයන්ගේ පිළිගැනීමයි. ඡන්දදායකයන් ලියාපදිංචි කිරීමේ සිට මැතිවරණ දිනයේ ඡන්දය ප්‍රකාශ කිරීමේ සිට අවසාන ප්‍රතිඵලය නිවේදනය කිරීම දක්වා වූ සෑම අදියරකදීම කිසිදු වරදකින් තොරව මෙම විද්‍යුත් ඡන්ද ප්‍රකාශන කටයුතු පවත්වාගෙන යාම සඳහා ගත හැකි තොරතුරු තාක්ෂණිකමය පියවරයන් පිළිබඳව පාර්ලිමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසින් සිසුන් වෙත කරුණු පැහැදිලි කරන ලදී .

එමෙන්ම රත්නපුර දිස්ත්‍රික්කයේ ඇහැලියගොඩ ජාතික පාසල විසින් මෙවර සිය ශිෂ්‍ය පාර්ලිමේන්තු මැතිවරණය සඳහා විද්‍යුත් ඡන්ද ක්‍රමයක් යොදාගැනීමට යොමුවීම අතිශය සුභවාදී ප්‍රවණතාවක් බව පාර්ලිමේන්තු නිලධාරීහු මෙම දැනුවත් කිරීමේ වැඩසටහනේදී පෙන්වා දුන්හ .

# පාර්ලිමේන්තුව සහ කොළඹ විශ්ව විද්‍යාලය එක්ව ආරම්භ කළ කෙටි කාලීන පාඨමාලාවේ පළමු අදියර සාර්ථකව අවසන් වෙයි

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව සහ කොළඹ විශ්ව විද්‍යාලය ඒකාබද්ධව ඉතිහාසයේ ප්‍රථම වරට ආරම්භ කළ පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රියා පටිපාටි පිළිබඳ කෙටි පාඨමාලාවේ පළමු අදියර සාර්ථකව පසුගියදා අවසන් විය.

කොළඹ විශ්වවිද්‍යාලයේ දේශපාලන විද්‍යා සහ රාජ්‍ය ප්‍රතිපත්ති අධ්‍යයනාංශයේ අවසන් වසර විද්‍යාර්ථීන්ගේ අධ්‍යයනය සඳහා ආරම්භ කරන ලද මෙම පාඨමාලාව සඳහා සම්පත් දායකත්වය ලබා දෙනු ලැබුවේ පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමා ප්‍රමුඛ පාර්ලිමේන්තු මහ ලේකම් කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසිනි.

මේ අනුව මේ මස 16 වැනිදා කොළඹ විශ්ව විද්‍යාලයේදී පාඨමාලාවේ සමාරම්භක අවස්ථාව පැවති අතර එහිදී සමාරම්භක මුඛ්‍ය දේශනය පවත්වන ලද්දේ පාර්ලිමේන්තුවේ මහ ලේකම් ධම්මික දසනායක මහතා විසිනි .






අනතුරුව මේ මස 29 සහ 30 යන දිනවලදී පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩල ප්‍රධානී සහ නියෝජ්‍ය මහ ලේකම් කුෂානි රෝහණදීර සහකාර මහ ලේකම් ටිකිරි කේ. ජයතිලක සහ ව්‍යවස්ථාදායකසේවා අධ්‍යක්ෂ සහ සන්නිවේදන වැඩබලන අධ්‍යක්ෂ එච්.ඊ. ජනකාන්ත සිල්වා යන මහත්ම මහත්මීහු දේශන ඉදිරිපත් කළහ.

ප්‍රජාතන්ත්‍රවාදය සහ පාර්ලිමේන්තු ක්‍රමවේදය පිළිබඳව න්‍යායාත්මක දැනුම මෙන්ම පාර්ලිමේන්තුවේ ප්‍රායෝගික අත්දැකීම් ඇසුරින් ඉදිරිපත් කළ මෙම කෙටි පාඨමාලාව විශ්ව විද්‍යාල විද්‍යාර්ථීන්ට නවමු අත්දැකීමක් මෙන්ම ඉහළ වටිනාකමක් සහිත කෙටි පාඨාමාලාවක් වූ බව පාඨමාලාව අවසානයේ අදහස් දක්වමින් කොළඹ විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨයේ දේශපාලන සහ රාජ්‍ය ප්‍රතිපත්ති අධ්‍යයනාංශයේ අංශාධිපති ආචාර්ය ප්‍රදීප් පීරිස් සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ධම්ම දිසානායක යන මහත්වරු පෙන්වා දුන්හ.

එසේම මෙම කෙටි පාඨමාලාව අනෙකුත් විශ්ව විද්‍යාලවල ද දේශපාලන විද්‍යාව හදාරන විද්‍යාර්ථීන්ට ලබා දීමේ වැදගත්කම ද ඔවුහු පෙන්වා දුන්හ.

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විශ්ව විද්‍යාලයක් හා එක්ව මෙවැනි ශාස්ත්‍රීය පාඨමාලාවක් ආරම්භ කරන ලද ප්‍රථම අවස්ථාව මෙයයි.






© Parliament of Sri Lanka





# කොළඹ 04 මුස්ලිම් කාන්තා විදුහල සිසුවියන් සඳහා පාර්ලිමේන්තුවෙන් විදු පියස වැඩසටහනක්

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලද පාර්ලිමේන්තු ක්‍රමවේදය පිළිබඳ දැනුවත්කිරීමේ වැඩසටහනක් කොළඹ 04 මුස්ලිම් කාන්තා විදුහලේ සිසුවියන් සඳහා පසුගියදා පැවැත්විණි.

මෙහිදී පාර්ලිමේන්තුවේ අධ්‍යක්ෂ (ව්‍යවස්ථාදායක සේවා) ජනකාන්ත සිල්වා මහතා විසින් පාර්ලිමේන්තු රැස්වීම් දිනක ක්‍රියාවලිය පිළිබඳව හැඳින්වීම සිදුකළ අතර අධ්‍යක්ෂ පරිපාලන ජී.තච්චනරාණි මෙනවිය විසින් පනත් කෙටුම්පත් ක්‍රියාවලිය පැහැදිලි කරන ලදී.

මෙම වැඩසටහනට එම පාසලේ විදුහල්පතිනී නස්රියා මුනාස් ඇතුළු ගුරුවරුන් සහ සිසුවියන් විශාල පිරිසක් එක්ව සිටියහ.










# පාර්ලිමේන්තු විවාද නැරඹීම සඳහා පාසල් සිසුන්ට යළි අවස්ථාව





පාර්ලිමේන්තු රැස්වීම් පැවැත්වෙන දිනවල දී පාර්ලිමේන්තුව නැරඹීමට සහ පාර්ලිමේන්තු විවාද නැරඹීමට පාසල් දරුවන් සඳහා අවස්ථාව ලබා දීම පිළිබඳව පාර්ලිමේන්තුවේ වේත්‍රධාරී නරේන්ද්‍ර ප්‍රනාන්දු මහතා ඉදිරිපත් කරන ලද යෝජනාවට පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ අනුමතිය මේ මස 21 වැනිදා හිමි විය.

ඒ අනුව පාර්ලිමේන්තු සභාගර්භයේ ඇති මහජන ගැලරියේ සිට පාර්ලිමේන්තු විවාද සජීවීව නැරඹීමේ අවස්ථාව පාසල් දරුවන් වෙත හිමිවේ.

කොවිඩ් තත්ත්වය සහ ආරක්ෂක හේතූන් මත පාර්ලිමේන්තුව නැරඹීම සඳහා පනවා තිබූ සීමාවන් පසුගිය සැප්තැම්බර් 20 දින සිට ලිහිල් කළ ද පාර්ලිමේන්තු රැස්වීම් දිනවල දී ඒ සඳහා අවස්ථාව හිමි නොවිණි.

මේ අනුව පාසල් බලධාරීන් හට තම අයදුම්පත් වේත්‍රධාරී වෙත ලිපියක් මඟින් ෆැක්ස් මඟින් 0112777473/ 0112777335 හෝ www.parliament.lk වෙබ් අඩවිය හරහා මාර්ගගතව අයදුම් කළ හැකි ය.





# කාරක සභා පුවත්













# වෘත්තීය පුහුණු ආයතන සමග ඒකාබද්ධව පුහුණු ශ්‍රමිකයන් වැඩි වශයෙන් විදේශ රැකියා සඳහා යොමු කිරීමට වඩාත් කාර්යක්ෂම වැඩපිළිවෙලක් ....








## # කෝපා කමිටුව විදේශ රැකියා අමාත්‍යාංශයට සහ විදේශ සේවා නියුක්ති කාර්යාංශයට නියෝග කරයි

වෘත්තීය පුහුණු ආයතන සමග මනා සම්බන්ධීකරණයෙන් පුහුණු ශ්‍රමිකයන් වැඩි වශයෙන් විදේශ රැකියා සඳහා යොමු කිරීමට වඩාත් කාර්යක්ෂම වැඩපිළිවෙළක් සහිත සැලැස්මක් සති දෙකක් තුළ සකස් කරන ලෙස රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් (කෝපා කමිටුව) විදේශ රැකියා අමාත්‍යාංශයට සහ විදේශ සේවා නියුක්ති කාර්යාංශයට පසුගියදා උපදෙස් ලබා දෙන ලදී.

විදේශ රැකියා ක්ෂේත්‍රයේ ගුණාත්මක වර්ධනය උදෙසා ඉටුවිය යුතු කාර්යභාරය ඇගයීම පිළිබඳව වූ කාර්ය සාධන විගණන වාර්තාව පරීක්ෂාව සඳහා රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව මේ මස 21 වැනිදා පාර්ලිමේන්තු මන්ත්‍රී කබීර් හෂීම් මහතාගේ සභාපතීත්වයෙන් රැස්වූ අවස්ථාවේ දී මෙම උපදෙස් ලබා දීම සිදුවිය.
මේ අනුව එම ආයතන ඉදිරියේදී නැවත කෝපා කමිටුව හමුවට කැදවන බව ද කමිටු සභාපතිවරයා පැවසීය.

විදෙස් රැකියා සඳහා පුහුණු ශ්‍රමිකයන්හට විශාල ඉල්ලුමක් තිබුණ ද ඉල්ලුමට සරිලන පුහුණු ශ්‍රමිකයන් මෙරටින් යැවීමට නොහැකි වීම බරපතල ගැටලුවක් බව ද 2021 වසරේ මෙය 33%ක් තරම් පහළ අගයක් ගෙන ඇති බවත් මෙහිදී කමිටු සභාපතිවරයා පෙන්වා දුන්නේය. අදාළ වගකිව යුතු ආයතන මනා සම්බන්ධීකරණයෙන් නිශ්චිත වැඩපිළිවෙළක් ක්‍රියාත්මක නොවීම මෙයට හේතුවී ඇති බව ද කමිටුව පෙන්වා දුන්නේය.



මේ අනුව විදෙස් රැකියා අමාත්‍යාංශය විදේශ සේවා නියුක්ති කාර්යාංශය මෙරට වෘත්තීය පුහුණු ආයතන සමග එක්ව ලොව නව රැකියා වෙළඳපළ පිළිබඳ නිරන්තර අවධානයෙන් යුතුව අදාළ ඉල්ලුම පවතින ක්ෂේත්‍රයන්ට අදාළව ශ්‍රමිකයන් පුහුණු කිරීම සඳහා නව සැලැස්මක් සහිත කාර්යක්ෂම වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව කමිටුව අවධාරණය කරන ලදී.

ජාතික විගමනික ශ්‍රමික ප්‍රතිපත්තියක් මේ වන විට සකසා තිබුණ ද මෙය පදනම්කරගෙන ක්‍රියාත්මක නොවීම පිළිබඳව ද කමිටුවේ අවධානය යොමුවිය. මේ අනුව මෙම ප්‍රතිපත්ති කාලීන වශයෙන් යාවත්කාලීන කිරීම කළ යුතු බව ද කමිටුව අවධාරණය කළේ ය. එම කටයුතු ආරම්භ කර ඇති බව මෙහිදී නිලධාරීහු පැවසුවද එහි ප්‍රමාදයක් පවතින බව පෙනී යන බවත් විදේශ රැකියා ශ්‍රමිකයන් යැවීමට අදාළ මූලික සැකස්ම ඇත්තේ මෙම ප්‍රතිපත්තීන් තුළ බැවින් නිශ්චිත සැලැස්මක් සහ අරමුණක් සහිතව ක්‍රියාත්මක වීමේ අවශ්‍යතාව කමිටුව විසින් පෙන්වා දෙන ලදී.
2016 වසරේ ඇමරිකා එක්සත් ජනපදය සහ මෙරට රජය අතර ඇති කරගත් ගිවිසුමකට අනුව සුදුසුකම් සහිත හෙදියන් සඳහා එරට අවකාශය තිබුණ ද ඊට අයදුම් කර තිබූ හෙදියන් 425ක පිරිසක් අතුරින් අදාළ භාෂා ප්‍රවීණතා විභාගයෙන් සමත් වූයේ හෙදියන් තිදෙනෙක් බව ද මෙහිදී අනාවරණය විය.

ජපානය, කොරියාව, ඊශ්‍රාලය වැනි රටවල රජයයන් අතර පවතින ගිවිසුම් අනුව ද පුහුණු ශ්‍රමිකයන් යැවීම සඳහා අවකාශය තිබුණ ද අදාළ රටවල භාෂා ප්‍රවීණත්වය මෙන්ම වෘත්තිමය කුසලතාව සහිත පිරිස අඩුවීම නිසා මෙරටින් විදෙස්ගත වන පුහුණු ශ්‍රමික පිරිස අවම වන බව මෙහිදී හෙළිවිය. මෙහි දී කමිටුව දීර්ඝ වශයෙන් පෙන්වා දුන්නේ අදාළ තානාපති සබඳතා ඔස්සේ රැකියා අවස්ථා විවර කර ගැනීම මෙන්ම ඊට අදාළව වෘත්තීය කුසලතාව සහිත ශ්‍රමිකයන් පුහුණු කිරීම සඳහා විදේශ සේවා නියුක්ති කාර්යාංශය ඇතුළු මෙම ආයතන ක්‍රියාත්මක විය යුතු බවයි.

මෙරට ආර්ථික අර්බුදයක සිටින අවස්ථාවක විදේශ විනිමය උපයන උල්පතක් බඳු මෙම විදේශ රැකියා ක්ෂේත්‍ර හඳුනාගෙන ප්‍රවර්ධනය කිරීමේ අවශ්‍යතාව කමිටුව දීර්ඝ ලෙස පෙන්වා දුන්නේය. ඒ සඳහා විදේශ සේවා නියුක්ති කාර්යාංශය තුළ පවතින පර්යේෂණ අංශය ද වඩාත් කාර්යක්ෂමව ක්‍රියාත්මක වීමේ අවශ්‍යතාව ද මෙහිදී කමිටුව අවධාරණය කරන ලදී.

# විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සඳහා ජාතික ප්‍රතිපත්තියක් සැකසීම සඳහා අවධානය

■ ළමයින් සඳහා වන පාර්ලිමේන්තු සංසදයේදී සාකච්ඡා කෙරේ.

ශ්‍රී ලංකාවේ විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ යහපැවැත්ම තහවුරු කිරීම සඳහා ජාතික ප්‍රතිපත්තියක් සැකසීමේ අවශ්‍යතාවය පිළිබඳ ළමයින් සඳහා වන පාර්ලිමේන්තු සංසදයේ අවධානය යොමුව තිබේ. මේ පිළිබඳ අදහස් පළ වූයේ ළමයින් සඳහා වන පාර්ලිමේන්තු සංසදය මේ මස 18 වැනිදා එහි සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මියගේ ප්‍රධානත්වයෙන් පාර්ලිමේන්තුවේ දී රැස්වූ අවස්ථාවේදී ය .

මෙරට දරුවන්ගේ යහපැවැත්ම සම්බන්ධයෙන් සංසදයේ ඉදිරි වැඩකටයුතු පිළිබඳව සාමාජික මන්ත්‍රීවරයන්ගේ අදහස් හා යෝජනා ද මෙහිදී විශේෂ අවධානයට ලක්විය.

ඒ අනුව ළමා රැකවරණය පිළිබඳ විශේෂ අවධානය යොමු කරමින් කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය හා ඒ හා සම්බන්ධ වෙනත් ආයතන ,පොලිස් ළමා හා කාන්තා කාර්යාංශ හා එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF) යන ආයතනයන්හි නියෝජිතයින් සමඟ ළමුන්ගේ රැකවරණය සම්බන්ධ ගැටලු හා යෝජනා පිළිබඳව පුළුල්ව සාකච්ඡා කිරීමට මෙහිදී තීරණය කෙරිණි.



මෙරට දරුවන් හා සම්බන්ධ විවිධ ක්ෂේත්‍රයන් පිළිබඳව ද අවධානයට ලක් වූ අතර සමස්ත ළමා ජනගහනයට ගුණාත්මක අධ්‍යාපනය ලබා දීම, ප්‍රමාණවත් සෞඛ්‍ය රැකවරණයක් ලබාදීමට, පවතින සම්පත් හා නිලධාරීන් වඩාත් කාර්යක්ෂම කිරීම, ළමුන් අපයෝජනයට ලක් වීමට පෙර එවැනි වටපිටාවන් හඳුනා ගනිමින් ඒ පිළිබඳ අවශ්‍ය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම, මනා පෝෂණයක් ලබා ගැනීමට ඇති ප්‍රවේශය සහතික කිරීම හා ළමුන්ගේ හැකියාවන් වර්ධනය කිරීමට අවස්ථාවන් නිර්මාණය කිරීම යනාදිය මෙහිදී අවධානයට යොමු වූ විශේෂ කරුණු වේ. එමෙන්ම ග්‍රාමීය, නාගරික හා වතු ජනතාවගේ දරුවන් සඳහා තිබෙන විවිධාකාර වූ ගැටලුවලට වෙන් වෙන් වශයෙන් විසඳුම් සෙවීම අත්‍යවශ්‍ය බව මෙහිදී තවදුරටත් අවධාරණය විය.

පළාත් කොමසාරිස්වරුන්ගේ අදහස් හා යෝජනාවන්වල ප්‍රමුඛත්වයෙන් දරුවන් සම්බන්ධ රජයේ නිලධාරීන් හා රාජ්‍ය නොවන සංවිධානයන්හි නිලධාරීන් සමඟ නව තාක්ෂණය භාවිත කරමින් ඉදිරියට කටයුතු කිරීමට සංසදයේ මන්ත්‍රී සාමාජිකයන් එකඟ වීම ද මෙහිදී විශේෂ විය. ළමුන්ගේ ගැටලුකාරී අවස්ථාවලදී මාධ්‍ය භාවිතය පිළිබඳව අප්‍රසාදය පළ කළ සංසදයේ මන්ත්‍රී සාමාජිකයින්ගේ පොදු අවධානය යොමු වුයේ ඊට අදාළ අමාත්‍යාවරයා සමඟ එක්ව නිසි වැඩපිළිවෙළක් හා ප්‍රතිපත්තියක් නිර්මාණය කළ යුතු බවයි. මීට අමතරව ළමා මන්දපෝෂණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් නිර්මාණය කිරීමේ අවශ්‍යතාවය ද මෙහි දී සාකච්ඡා විය.

# රටතුළ නිශ්චිත සහල් සංචිත පවත්වා ගත නොහැකිවීම පිළිබඳ කෝපා කමිටුවේ අවධානය

සාර්ක් සංවිධානයේ කොළඹ ප්‍රඥප්තිය හා 16 වන සමුළු රැස්වීමට අනුව මෙට්‍රික් ටොන් 8000ක විශේෂ සහල් සංචිතයක් පවත්වාගත යුත වීම සහ 2008/8/27 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව දිවයින පුරා පවතින ආහාර දෙපාර්තමේන්තුව සතු ගබඩාවල මෙට්‍රික් ටොන් 100000 ක ආරක්ෂිත සහල් සංචිත පවත්වාගෙන යාම සිදු නොවීම සම්බන්ධව කමිටුවේ අවධානය යොමු විය.

වේයන්ගොඩ ගබඩා සංකීර්ණයේ පැවති අංක 1,7,8,9,10 හා 13 යන ගබඩා 06 විද්‍යාත්මක සහ ස්වභාවික ලෙස නවීකරණය කොට තිබිය දී උක්ත සංචිත පවත්වා ගැනීමට අපොහොසත් වීම සම්බන්ධව මෙහි දී කමිටු සාමාජිකයන් විසින් විමසන ලදී. මෙම ගබඩා නවීකරණය කිරීම සඳහා 2012 සිට 2019 දක්වා රුපියල් මිලියන 292ක් වැය කර තිබේ.

මේ පිළිබඳ සාකච්ඡා වූයේ පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව එහි සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී කබීර් හෂීම් මහතාගේ ප්‍රධානත්වයෙන් මේ මස 20 වැනිදා රැස්වූ අවස්ථාවේදීය. ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් ආරක්ෂිත සහල් සංචිත පවත්වාගෙන යාම හා ගබඩා උපයෝජනයේ කාර්යසාධනය පිළිබඳ විගණන වාර්තාව විමර්ශනය කිරීම සඳහා මෙම රැස්වීම කැඳවා තිබිණි.

එහිදී නිලධාරීන් සඳහන් කළේ සිය දෙපාර්තමේන්තුවට ප්‍රමාණවත් ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරයෙන් ඉල්ලා සිටිය ද එය නොලැබීම හේතුවෙන් ඉහත සඳහන් සංචිත පවත්වා ගැනීම සිදු කළ නොහැකි වූ බවයි. සාමාන්‍යයෙන් සහල් මෙට්‍රික් ටොන් 100000ක් පවත්වා ගැනීමට වසරකට රුපියල් බිලියන 22ක් පමණ අවශ්‍ය වන බව ද මෙහිදී අනාවරණය විය.

මෙට්‍රික් ටොන් 250000ක් ගබඩා කළ හැකි ගබඩා සංකීර්ණයක් විද්‍යාත්මකව නවීකරණය කළ ද එහි ධාරිතාවය උපරිමයට සමාන සංචිත ප්‍රමාණයක් ගබඩා කිරීමට මේ තාක් නොහැකි වූ බවත් මේ වන විට ලැබෙමින් පවතින ලෝක ආහාර වැඩසටහනේ අධාර සහ අනෙකුත් රටවල් වලින් ලැබෙන සහල් ආධාර ගබඩා කිරීම මේ වන විට ආරම්භ කර ඇති බවත් එහි දී නිලධාරීහු දැනුම් දුන්හ.

රට පුරා පවතින රජයේ ආහාර ගබඩා සංකීර්ණ පිළිබඳ නිසි පර්යේෂණයක් සිදු කොට දත්ත එක්රැස් කරන ලෙස සහ ගබඩා වල අයිතිය පිළිබඳ නිශ්චිත තොරතුරු ඇතුළත් වාර්තාවක් මාසයක් තුළ ඉදිරිපත් කරන ලෙසද කමිටුව අමාත්‍යාංශ ලේකම්වරයා වෙත දැනුම් දුන්නේය.



# මෙරට ව්‍යවසායකත්වය සඳහා පවතින බාධක ඉවත්කිරීම සඳහා නව ප්‍රතිපත්තිමය රාමුවක් - ජාතික සභා ප්‍රතිපත්ති සම්පාදන අනු කමිටුවෙන් නිර්දේශ

- **පාසල් අවධියේ සිටම ව්‍යවසායකත්වය පිළිබඳ ආකල්ප වර්ධනය කිරීම සඳහා අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රතිපත්ති සැකස්මටත් යෝජනා**

- **මෙරට නිසි අධ්‍යාපනයක් රැකියාවක් හෝ කිසිදු පුහුණුවක් නොමැති වෘත්තීය අරමුණකින් තොර තරුණ පිරිස ලක්ෂ 08 ක් බවත් අනාවරණය වෙයි**

- **විදුලි බල හා බලශක්ති ක්ෂේත්‍රයේ නව ප්‍රතිපත්ති සම්පාදනය පිළිබඳවද මූලික කරුණු සාකච්ඡා කෙරේ**

මෙරට ව්‍යවසායකත්වය සඳහා පවතින බාධක ඉවත්කොට නව ප්‍රතිපත්තිමය රාමුවක් කඩිනමින් සැකසීම සඳහා සියලු අදාළ ආයතන සම්බන්ධීකරණයෙන් සති දෙකක් තුළ මූලික සාකච්ඡාවක් සංවිධානය කරන ලෙස ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ දී ප්‍රමුඛතා හඳුනා ගැනීම පිළිබඳ ජාතික සභා අනු කමිටුවේ සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නාමල් රාජපක්ෂ මහතා මිනිස් බල හා රැකී රක්ෂා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් අනූෂා ගෝකුල මහත්මියට උපදෙස් ලබා දුන්නේය.

ව්‍යවසායක් මෙරට ආරම්භ කිරීම මේවන විට සංකීර්ණ ක්‍රියාවලියක් වී ඇති බැවින් දියුණු රටවල මෙන් එය ඉතා සරල සහ පහසු කාර්යක් ලෙස සකස් වීමට ප්‍රතිපත්තිමය රාමුවක් සකස් විය යුතු බවද අනුකමිටුවේ දී අවධාරණය කෙරිණි. ප්‍රාදේශීය ලේකම් සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ අදාළ ආයතන සම්බන්ධීකරණයෙන් මෙම ක්‍රියාවලිය වඩාත් පහසුවෙන් කාර්යක්ෂමව සිදු කිරීමට අවශ්‍ය නෛතික සහ ප්‍රතිපත්තිමය වෙනස්කම් මීළඟ කමිටු රැස්වීමේ දී සාකච්ඡාකොට තීරණය කිරීමට ද අනුකමිටුවේ එකඟත්වය පළ විය.

ව්‍යවසායකත්වය හා ආයෝජන දිරිමත් කිරීම සම්බන්ධ ජාතික ප්‍රතිපත්ති සම්පාදනය කිරීම පිළිබද සාකච්ඡා කිරීම සඳහා මිනිස් බල හා රැකී රක්ෂා දෙපාර්තමේන්තුව හා නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීහු කෙටි මධ්‍යම හා දිගුකාලීන ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ දී ප්‍රමුඛතා හඳුනා ගැනීම පිළිබඳ ජාතික සභා අනු කමිටුවට මේ මස 19 වැනිදා කැඳවා තිබූ අවස්ථාවේ දී මෙම නිර්දේශ ලබා දෙන ලදී.

ව්‍යවසායකත්වය ඇතුළු වෘත්තිය මාර්ගෝපදේශනය මෙරට සිසු දරු දැරියන්ට හිමිවිය යුතු අයිතියක් බැවින් මෙරට පාසල් අධ්‍යාපන පද්ධතියට එය ඇතුළත් වන ලෙස අධ්‍යාපන ප්‍රතිපත්තීන් වෙනස් විය යුතු බව මිනිස් බල හා රැකී රක්ෂා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් අනූෂා ගෝකුල මහත්මිය මෙහිදී පෙන්වා දුන්නාය.

මෑතකදී කරන ලද සමීක්ෂණයකට අනුව මෙරට අධ්‍යාපනය රැකියාවක් හෝ කිසිදු පුහුණුවක් නොමැති තරුණ පිරිස (Not in Employment Education Training / (NEET)) ලක්ෂ 8 කට ආසන්න බවත් වෘත්තීය අරමුණක් ද නොමැති ඔවුන්ට ව්‍යවසායකත්වය ඇතුළු වෘත්තීය මගපෙන්වීමක් අත්‍යවශ්‍ය බවත් ඇය පෙන්වා දුන්නාය.විශේෂයෙන්ම දියුණුවට පත්වූ ව්‍යවසායකයන් පිළිබඳ චරිතාපදාන ආදිය ද මෙරට අධ්‍යාපන විෂය නිර්දේශයන්ට ඇතුළත් විය යුතුබවත් පාසැල් අවධියේ සිටම සාම්ප්‍රදායික රැකියාවන්ගෙන් ඔබ්බට ගිය නව වෘත්තීය අවස්ථා සහ ව්‍යවසායකත්වය පිළිබඳ දරුවන් දැනුවත් කළ යුතු බවත් කමිටුවේ දී සාකච්ඡා විය. මේ අනුව 9 ශ්‍රේණියේ සිට හෝ තමන්ගේ හැකියාව සහ කැමැත්ත මත අදාළ වෘත්තිය ක්ෂේත්‍රයක් තෝරා

ගැනීම පිණිස නිසි මගපෙන්වීම සඳහා අධ්‍යාපන ප්‍රතිපත්තීන් සකස් විය යුතු බව ද ඊට අදාළ යෝජනා අධ්‍යාපන අමාත්‍යාංශය ඉදිරිපත් කොට ප්‍රතිපත්ති සකස් කරන ලෙසද කමිටුව විසින් උපදෙස් ලබා දෙන ලදී.

මේ අතර විදුලිබල සහ බලශක්ති ක්ෂේත්‍රයට අදාළව නව ප්‍රතිපත්ති සම්පාදනය කිරීම පිළිබඳව ද සාකච්ඡාවක් අද පැවැත්විණි. ප්‍රසම්පාදන ක්‍රියාවලිය කඩිනම් කිරීමේ අවශ්‍යතාව ඇතුළු විදුලිබල සහ බලශක්ති ක්ෂේත්‍රයේ අදාළ ආයතනවල කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමට අදාළව සිදුවිය යුතු ප්‍රතිපත්තිමය වෙනස්කම් පිළිබඳව මූලික කරුණු මෙහිදී සාකච්ඡා විය.








# බලශක්ති ක්ෂේත්‍රයේ ප්‍රතිව්‍යුහගත කිරීම් වලට අදාළ කමිටු වාර්තාව සති දෙකක් තුළ ජාතික සභාවට ඉදිරිපත් කිරීමට පියවර

බලශක්ති ක්ෂේත්‍රයේ ප්‍රතිව්‍යුහගත කිරීම් වලට අදාළ කමිටු වාර්තාව සති දෙකක් තුළ ජාතික සභාවට ඉදිරිපත් කරන බව විදුලිබල හා බලශක්ති අමාත්‍ය ගරු කංචන විජේසේකර මහතා ජාතික සභාව වෙත දැනුම් දුන්නේය .

ඒ සමගම ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය සහ ලංකා විදුලිබල මණ්ඩලය විසින් දියත් කිරීමට යෝජිත විවිධ බලශක්ති උත්පාදන ව්‍යාපෘති සඳහා ගැනීමට යෝජිත පියවර සම්බන්ධයෙන් ද ජාතික සභාව දැනුවත් කිරීමට අපේක්ෂා කරන බව ද අමාත්‍යවරයා දැනුම් දුන්නේය .



ජාතික සභාව එහි සභාපති කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් සහ අග්‍රාමාත්‍ය ගරු දිනේෂ් ගුණවර්ධන සහ විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතාගේ සහභාගිත්වයෙන් මේ මස (20) වැනිදා පාර්ලිමේන්තුවේ දී රැස්විය .

මෙහිදී ලංකා විදුලිබල මණ්ඩලය, ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය යන ආයතන ජාතික සභාව වෙත කැඳවා තිබූ අතර එහි දී නිලධාරීන් විසින් බලශක්ති ක්ෂේත්‍රයේ ප්‍රගමණයට අදාළ අදහස් සහ යෝජනා ඉදිරිපත් කරන ලදී .

මෙම රැස්වීමේ දී ජාතික සභාවේ අනු කමිටු වන කෙටි මධ්‍යම හා දිගුකාලීන ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ දී ප්‍රමුඛතා හඳුනා ගැනීම පිළිබඳ ජාතික සභා අනු කමිටුවේ සභාපති ලෙස පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නාමල් රාජපක්ෂ මහතා සහ ආර්ථිකය ස්ථායීකරණයට අදාළ කෙටි සහ මධ්‍ය කාලීන වැඩසටහන් හඳුනා ගැනීම සඳහා වන ජාතික සභා අනු කමිටුවේ සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු පාඨලී චම්පික රණවක මහතා විසින් සිය කමිටුවල ප්‍රගතිය සහ ඉදිරි කටයුතු සම්බන්ධව ජාතික සභාව දැනුවත් කරන





# රාජ්‍ය ආයතනවල කාර්යසාධනය මැනීමට ප්‍රධාන කාර්ය දර්ශක (KPIs) හඳුන්වා දීමට නව ප්‍රතිපත්ති සම්පාදනය කෙරේ

රාජ්‍ය ආයතනවල කාර්ය සාධනය මැනීමට ප්‍රධාන කාර්ය දර්ශක (KPIs) / (Key Performance Indicators) හඳුන්වා දීමට පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නාමල් රාජපක්ෂ මහතාගේ සභාපතීත්වයෙන් මේ මස 26 වැනිදා පැවති ජාතික ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ දී ප්‍රමුඛතා හඳුනාගැනීම පිළිබඳ ජාතික සභා අනු කමිටුවේ දී තීරණය විය.

රාජ්‍ය යාන්ත්‍රණය වඩාත් ඵලදායි සහ කාර්යක්ෂම කිරීම සඳහා රාජ්‍ය ආයතන සහ රාජ්‍ය නිලධාරීන්ගේ ප්‍රගතිය සමාලෝචනය සඳහා මිනුම් දඬු සකස් කිරීමේ අවශ්‍යතාව කමිටුවේ දී අවධාරණය කෙරිණි.

මේ අනුව පරිපාලන සේවය ඇතුළු අනෙකුත් දීපව්‍යාප්ත සියලු සේවාවන් එක්වී මේ පිළිබඳව ඉදිරි සතියේ සාකච්ඡා කර ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ කටයුතු ඇරඹීමට ද මෙහිදී තීරණය විය.

රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමය නියෝජනය කරමින් නිලධාරීහු මෙම අවස්ථාවට සහභාගි වූහ.







# නිසි පෝෂණය සහිත ආහාර වේලක් ලැබෙන ප්‍රමාණය රටේ ජනතාවගෙන් 1/5ක් පමණයි

■ **ආර්ථිකය ස්ථායීකරණයට අදාළ කෙටි සහ මධ්‍ය කාලීන වැඩසටහන් හඳුනා ගැනීම සඳහා වන ජාතික සභා අනු කමිටුවේ දි සාකච්ඡා කෙරේ**

නිසි පෝෂණය සහිත ආහාර වේලක් ලැබෙන ප්‍රමාණය රටේ ජනතාවගෙන් 1/5ක් පමණක් බවත් රටේ ජනතාවගේ අදායමෙන් 75%ක්ම ආහාර සඳහා වියදම් වන බවත් ආර්ථිකය ස්ථායීකරණයට අදාළ කෙටි සහ මධ්‍ය කාලීන වැඩසටහන් හඳුනා ගැනීම සඳහා වන ජාතික සභා අනු කමිටුවේ දි අනාවරණය විය.

මේ කරුණු සාකච්ඡා වූයේ ආර්ථිකය ස්ථායීකරණයට අදාළ කෙටි සහ මධ්‍ය කාලීන වැඩසටහන් හඳුනා ගැනීම සඳහා වන ජාතික සභා අනු කමිටුව එහි සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු පාඨලී චම්පික රණවක මහතාගේ ප්‍රධානත්වයෙන් පාර්ලිමේන්තුවේ දී මේ මස 18 වැනිදා රැස් වූ අවස්ථාවේදීය.

ආහාර සුරක්ෂිතතාව සහ පෝෂණ සුරක්ෂිතතාව, පොහොර අවශ්‍යතාවය, අස්වැන්නේ ඉදිරි අඩුවීම මන්දපෝෂණ තත්ත්වය සහ එයින් ඇතිවිය හැකි සමාජීය අතුරුඵල ආදිය පිළිබඳ විද්වත් අදහස් ලබා ගැනීම සඳහා මෙම රැස්වීම කැඳවා තිබිණි ණය ප්‍රතිව්‍යුහගතකරණය සහ රටේ ඖෂධ භාවිතය පිළිබඳ විද්වත් අදහස් ලබා ගැනීම කමිටුව විසින් මීට පෙර සිදු කරන ලදී.

විශේෂයෙන් වසර දහයක පමණ කාලයක් තිස්සේ රටේ පවතින මන්දපෝෂණ තත්ත්වය වර්තමානයේ දී පවතින ආර්ථික අර්බුදයත් සමග උත්සන්න වී ඇති නිසා මෙම තත්ත්වය පිටුදැකීම සඳහා ගත හැකි කෙටි කාලීන සහ මධ්‍යකාලීන පියවර සම්බන්ධයෙන් මෙහිදී සාකච්ඡා කෙරිණි.

මෙහිදී සභාපතිවරයා මුදල් අමාත්‍යාංශය වෙත දැනුම් දුන්නේ ආදායම් සහ ගෘහස්ථ වියදම් පිළිබඳ සමීක්ෂණය වහාම සිදු කරන ලෙසයි. මෙම අදාළ සමීක්ෂණය 2019 න් පසු සිදු කොට නොමැති බවද සභාපතිවරයා දැනුම් දුන්නේය. එම සමීක්ෂණය මගින් මෙම ආර්ථික අර්බුදයේ සමාජීය ප්‍රතිඵල පිළිබඳ නිවැරදි තොරුතුරු ලැබෙන බවත් එම තොරතුරු ඉදිරි වැඩපිළිවෙළ සැකසීමේදී ඉතා වැදගත් වන බවද රණවක මහතා සඳහන් කළේය.

රට තුළ බදු වැඩි කිරීම් ආදී ක්‍රියාමාර්ග මගින් ආදායම් වැඩි කළද එහි අතුරු සමාජීය ප්‍රතිඵල ලෙස කර්මාන්ත පවත්වා ගැනීමේ ගැටලුව, රැකියා අහිමිවීම් සහ පෝෂණය තත්ත්වයන් පහත වැටීම වැනි කරුණු දැඩි බලපෑමක් එල්ල කරනු ඇති බවට ද මෙහිදී සාකච්ඡා විය.

එමෙන්ම පුද්ලයෙකුගේ ජීවිතයේ මුල් දින 8000 නිසි පෝෂණ තත්ත්වයෙන් පවත්වා ගැනීමේ වැදගත්කම සහ ඒ සඳහා පවතින ආහාර නිසි සුරක්ෂිතතාවෙන් යුතුව පරිහරණය කිරීම පිළිබඳ ජනතාව දැනුවත් කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව මෙහිදී අදහස් පළ විය.





# ෆේස්බුක් ඔස්සේ මන්ත්‍රී වරප්‍රසාද කඩකළ බව පිළිගත් පුද්ගලයා ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාව ඉදිරියේ සමාව ගනියි

ෆේස්බුක් සමාජ මාධ්‍ය ඔස්සේ මන්ත්‍රී වරප්‍රසාද කඩකළ බව පිළිගත් පුද්ගලයෙකු ඒ පිළිබඳව කනගාටුව ප්‍රකාශ කරමින් පසුගියදා ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවේ දී සමාව ගැනීම සිදුවිය.

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ආර්. සම්බන්දන් මහතාට අපහාසාත්මක අයුරින් පළ කර තිබූ මෙම වීඩියෝව තුළින් ඒ මහතාගේ වරප්‍රසාද කඩවී ඇති බවට පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු එම්.ඒ.සුමන්තිරන් මහතා සිදු කළ පැමිණිල්ලකට අනුව අදාළ ෆේස්බුක් පිටුව අයත් පුද්ගලයා වරප්‍රසාද කමිටුවට පසුගියදා කැඳවා තිබිණි.

අධිකරණ බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගරු විජේදාස රාජපක්ෂ මහතාගේ සභාපතීත්වයෙන් මේ මස 04 වැනිදා පාර්ලිමේන්තුවේදී රැස් වූ ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවේ දී මෙම සිදුවීමට අදාළ විමර්ශණ කටයුතු සිදුවිය.

මෙහිදී තමා අතින් මන්ත්‍රී වරප්‍රසාද කඩවීමක් සිදුවී ඇති බව එම පුද්ගලයා පිළිගැනීම නිසා දෙපාර්ශ්වයේ එකගතාව මත කොන්දේසි සහිතව සිද්ධිය සමථයකට පත්කිරීමට තීරණය විය. මේ අනුව මේ පිළිබඳව කනගාටුව පළ කරමින් සමාව අයැද ප්‍රසිද්ධ පුවත්පතක මෙන්ම එම ෆේස්බුක් පිටුවේ ප්‍රකාශයක් පළ කිරීම යන කොන්දේසි මත පැමිණිල්ල විභාග කිරීම අවසන් කරන ලද අතර ඉදිරියේ දී මෙවැනි ක්‍රියාවලින් වළකින ලෙස තරයේ අවවාද කරමින් කමිටුව විසින් ඔහුව නිදහස් කරන ලදී.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු හෝ පොදුවේ පාර්ලිමේන්තුව පිළිබඳව අපහාසාත්මක ප්‍රකාශයක් සිදු කළහොත් පාර්ලිමේන්තු බලතල සහ වරප්‍රසාද පනත යටතේ දඬුවම් කිරීමේ බලය පාර්ලිමේන්තුවට මෙන්ම ශ්‍රේෂ්ඨාධිකරණයට පවතින බව කාරක සභා සභාපතිවරයා මෙහි දී පෙන්වා දුන්නේය. පාර්ලිමේන්තු බලය යටතේ අවවාද කිරීමට හෝ සය මසක් පාර්ලිමේන්තු පරිශ්‍රයට ඇතුළු වීම තහනම් කිරීමට ද බලය පවතින බවත්, යම් වරදක් සිදුවී ඇති බව ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාව විසින් තීරණය කරන්නේ නම් එය ශ්‍රේෂ්ඨාධිකරණයට යොමු කළ හැකි බවත් පෙන්වා දුන්නේය. ඒ අනුව ඊට වරදකරු වුවහොත් වසර දෙකකට නොවැඩි සිර දඬුවමකට හෝ දඩ මුදලකටද නොඑසේනම් මෙම දෙකටමද යටත් කළ හැකි බව ද සභාපතිවරයා විසින් වැඩිදුරටත් පෙන්වා දෙන ලදී.

මේ අතර පාර්ලිමේන්තුවේ සමස්ත මන්ත්‍රීවරුන්ටම අපකීර්තියක් ගෙන දෙන අයුරින් අසත්‍යය ප්‍රවෘත්තියක් පළ කිරීමේ සිද්ධියක් සම්බන්ධයෙන් ප්‍රධාන පෙළේ සිංහල දිනපතා පුවත්පතක පාර්ලිමේන්තු මාධ්‍යවේදීන් දෙදෙනෙකු ද ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාව ඉදිරියට මේ මස 04 වැනිදා කැඳවන ලදී. "මැතිසබේ කැන්ටිමේ දියර කිරි හිඟවී මන්ත්‍රීවරු යකා නටති" යන සිරස්තලය යටතේ 2022 මාර්තු 09 දින එම පුවත්පතේ පළ කළ ප්‍රවෘත්තියක් සම්බන්ධයෙන් මෙම පැමිණිල්ල සිදුකර තිබුණේ පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ජයන්ත කැටගොඩ මහතා විසිනි.

මේ අනුව මෙම අසත්‍ය ප්‍රවෘත්තිය හරහා සමස්ත පාර්ලිමේන්තුව සහ මන්ත්‍රීවරුන් කෙරෙහි මහජනතාව තුළ වෛරයක් ඇතිවීමට හේතුවී ඇති බව කැටගොඩ මන්ත්‍රීවරයා පැවසීය. මේ පිළිබඳව පාර්ලිමේන්තුවේ ආහාර හා ගෘහ පාලන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා ද කාරක සභාව ඉදිරියට කැඳවන ලද අතර මෙහිදී ඔහු පවසා සිටියේ මේ පිළිබඳව තමා සොයාබැලීමක් සිදුකළ බවත් එහි දී එවැනි කිසිදු සිදුවීමක් පිළිබඳ තොරතුරු වාර්තා නොවූ බවත්ය.

මේ අනුව අසත්‍ය තොරතුරු පළ කිරීමක් මගින් සමස්ත පාර්ලිමේන්තුවේම ගෞරවයට හානියක් සිදුවී ඇති බව පෙනී යන බවත් ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදීන් ලෙස වඩාත් වගකීමෙන් යුතුව වාර්තාකරණයේ නියැලීමේ අවශ්‍යතාවත් කාරක සභා සභාපතිවරයා පෙන්වා දුන්නේය.

මෙහි දී අධිකරණයමය ක්‍රියාමාර්ගවලින් තොරව මෙය විසදා ගැනීමට දෙපාර්ශ්වය එකග විය. මේ අනුව මෙම අසත්‍ය තොරතුරු පළ කිරීම පිළිබදව කනගාටුව පළ කරමින් ප්‍රකාශයක් සති දෙකක් තුළ පෙර ප්‍රවෘත්තියට ලබා දුන් ප්‍රසිද්ධියම ලබා දෙමින් අදාළ පුවත්පතේ පළ කිරීම සහ එහි පිටපතක් සතියක් තුළ පාර්ලිමේන්තු මහ ලේකම්වරයා වෙත එවීම ඉදිරියේ දී පාර්ලිමේන්තුව හෝ මන්ත්‍රීවරුන් කෙරෙහි එවැනි අපහාසාත්මක අසත්‍ය ප්‍රකාශ පළකිරීමෙන් වළකින බවට ද එකගවීම යන කොන්දේසිවලට යටත්ව මෙය සමථයකට පත්කරන බව කාරක සභා සභාපතිවරයා පැවසීය. එසේම මේ පිළිබඳව අවධානයෙන් යුතුව කටයුතු කරන ලෙස පුවත්පතේ ප්‍රධාන කර්තෘවරයාට ලිඛිතව දන්වන ලෙසද නියෝග කළේ ය.

මේ අතර පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු පාඨලී චම්පික රණවක මහතාගේ "වට්ස්ඇප්" දුරකථන ඇමතුම් පිළිබද දත්ත අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් නෛතික අවසරයකින් තොරව ලබා ගැනීම නිසා මන්ත්‍රීවරයාගේ වරප්‍රසාද කඩවීමට අදාළව සිදුකර තිබූ පැමිණිල්ල පිළිබදව ද කාරක සභාවේ අවධානය යොමුවිය. පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු පාඨලී චම්පික රණවක මහතා අමාත්‍යවරයෙකුව සිටි සමයේ එම අමාත්‍යාංශයේ සිදුවූ මූල්‍ය අවභාවිතාවක් පිළිබද සිදුකරන පරීක්ෂණයකට අදාළව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මෙම දත්ත ලබා ගෙන ඇති බව ද මෙහිදී සදහන් විය. මේ අනුව මේ පිළිබද ඉදිරි කටයුතු සදහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා නොවැම්බර් 18 වැනිදා ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට කැදවන ලෙස නියෝග කළේය.








# තොරතුරු පනතේ ක්‍රියාකාරීත්වය (2017-2021) ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව ආශ්‍රයෙන් සාකච්ඡා කිරීම





## I I කොටස

### තොරතුරු ඉල්ලීම් පළාත් අනුව වර්ගීකරණය

පාර්ලිමේන්තු මහ ලේකම් කාර්යාලය වෙත තොරතුරු ඉල්ලීම් ලැබුණු ආකාරය පළාත් අනුව සිදුකරන ලද දත්ත වර්ගීකරණය පහත 04 වැනි වගුවේ දැක්වේ. එය 4 වැනි රූපසටහන මගින් වැඩිදුරටත් පැහැදිලි කර ඇත.

| පළාත | සංඛ්‍යාත්මකව | | | | | ප්‍රතිශතාත්මකව | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2017 | 2018 | 2019 | 2020 | 2021 |
| මධ්‍යම | 7 | 6 | 1 | 2 | 4 | 6 | 4 | 1 | 2 | 5 |
| නැගෙනහිර | 7 | 8 | 2 | 3 | 6 | 6 | 5 | 2 | 3 | 7 |
| උතුරු මැද | 2 | 4 | 0 | 4 | - | 2 | 3 | 0 | 4 | 0 |
| උතුරු | 2 | 6 | 0 | 5 | 3 | 2 | 4 | 0 | 5 | 4 |
| වයඹ | 9 | 10 | 7 | 3 | 10 | 8 | 7 | 6 | 3 | 12 |
| සබරගමුව | 4 | 8 | 9 | 2 | 2 | 3 | 5 | 8 | 2 | 2 |
| ඌව | 0 | 2 | 2 | 3 | - | 0 | 1 | 2 | 3 | 0 |
| බස්නාහිර | 76 | 91 | 84 | 73 | 48 | 64 | 60 | 73 | 73 | 57 |
| දකුණ | 11 | 17 | 10 | 5 | 11 | 9 | 11 | 9 | 5 | 13 |
| | 118 | 152 | 115 | 100 | 84 | 100 | 100 | 100 | 100 | 100 |

**4 වගුව**




**4 රූපසටහන**


සෑම වසරකම 50% ඉක්මවූ ඉල්ලීම් සංඛ්‍යාවක් ලැබී තිබෙන්නේ බස්නාහිර පළාතින් වන අතර පාර්ලිමේන්තු කටයුතු සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන්නන් වැඩි පිරිසක් ජීවත්වනුයේ බස්නාහිර පළාතේ බැව් මින් පැහැදිලි වේ.

**අභියාචනා ලැබීම්**

තොරතුරු ඉල්ලීම්වලට පාර්ලිමේන්තුවේ තොරතුරු නිලධාරියා විසින් දෙන ලද පිළිතුරු සම්බන්ධයෙන් අතෘප්තියට පත් පුරවැසියන් විසින් පනතේ 31(1) වගන්තියට අනුව පාර්ලිමේන්තුවේ නම් කළ නිලධාරියා වෙත එවන ලද අභියාචනා පිළිබඳ දත්ත විස්තරය පහත 5 වැනි වගුවෙන් දක්වා ඇති අතර එය 05 වැනි රූපසටහන මගින් විශ්ලේෂණාත්මකව පැහැදිලි කර ඇත.

| අභියාචනා | සංඛ්‍යාත්මකව | | | | | ප්‍රතිශතාත්මකව | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2017 | 2018 | 2019 | 2020 | 2021 |
| ලැබුණු අභියාචනා | 18 | 29 | 20 | 11 | 14 | 100 | 100 | 100 | 100 | 100 |
| පිළිගත් අභියාචනා | 1 | 10 | 9 | 0 | 7 | 6 | 34 | 45 | 0 | 50 |
| ප්‍රතික්ෂේප කළ අභියාචනා | 17 | 19 | 11 | 11 | 7 | 94 | 66 | 55 | 100 | 50 |

5 වගුව




5 රූපසටහන


ඉහත දත්ත විශ්ලේෂණය කිරීමේ දී පාර්ලිමේන්තු මහ ලේකම් කාර්යාලය වෙත වැඩිම අභියාචනා සංඛ්‍යාවක් ලද වසර ලෙස 2018 වසර පෙන්වන අතර 2021 වසරේ දී එම අවස්ථාවන් අතුරින් 50% දීම තොරතුරු නිලධාරිගේ මතයට වෙනස් වූ මතයක් නම් කළ නිලධරයා විසින් ගෙන ඇති බවත් අනිකුත් සෑම වසරකදීම එය 50% කට වඩා අඩු අගයක් ගන්නා බවත් 2020 වසරේදී තොරතුරු නිලධාරිගේ මතයට වෙනස් වූ මතයක් නම් කළ නිලධරයා විසින් ගෙන නොමැති බවත් පැහැදිලි වේ.

## අභියාචනා විශ්ලේෂණය

නම් කළ නිලධරයා විසින් ලබාදුන් තීරණ සම්බන්ධයෙන් සෑහීමකට පත් නොවූ පුරවැසියන් විසින් පනතේ 32(1) වගන්තියට අනුව තොරතුරු කොමිසමට අභියාචනා යොමු කළ හැකිය. පාර්ලිමේන්තු මහ ලේකම් කාර්යාලයට එරෙහිව තොරතුරු කොමිසම වෙත අභියාචනා යොමු කිරීම පිළිබඳ දත්ත පහත 6 වැනි වගුවෙන් ඉදිරිපත් කර ඇති අතර එය 6 වැනි රූපසටහන මගින් විශ්ලේෂණාත්මක විග්‍රහයක් සිදු කර ඇත.

| අභියාචනා | වසර සහ සංඛ්‍යාව | | | | |
|---|---|---|---|---|---|
| | 2017 | 2018 | 2019 | 2020 | 2021 |
| ලැබුණු ඉල්ලීම් | 118 | 152 | 130 | 100 | 84 |
| අභියාචනා - පාර්ලිමේන්තුව වෙත | 18 | 29 | 20 | 11 | 14 |
| - (A) ඉල්ලීම්වල ප්‍රතිශතයක් ලෙස | 15 | 19 | 15 | 11 | 17 |
| අභියාචනා - කොමිසම වෙත | 0 | 5 | 6 | 3 | 1 |
| - (B) පාර්ලිමේන්තුවට ලද අභියාචනාවල ප්‍රතිශතයක්ලෙස | 0 | 17 | 30 | 27 | 7 |

6 වගුව




6 රූපසටහන

ඉහත 6 වැනි වගුව සහ 6 වැනි රූපසටහන අධ්‍යයනය කිරීමේ දී පැහැදිලි වනුයේ අප හට ලද තොරතුරු ඉල්ලීම්වලින් 20%කට අඩු ප්‍රමාණයක් සඳහා පමණක් පාර්ලිමේන්තුව වෙත අභියාචනා ඉදිරිපත් වී ඇති බවත් එහි වැඩිම අගය වන 19% 2018 වසරේදී වාර්තා වී ඇති බවත් ය.

එමෙන්ම මෙම වසර 5 තුළ පාර්ලිමේන්තුවට එරෙහිව අභියාචනා 15ක් RTI කොමිසම වෙත යොමුකර තිබෙන අතර 2017 වසරේදී කිසිම අභියාචනයක් පාර්ලිමේන්තු මහ ලේකම් කාර්යාලයට එරෙහිව සෘඹෂ කොමිසම වෙත ලැබී නොමැති අතර 2019 වසරේදී එය අවස්ථා 06ක් දක්වා වර්ධනය වී ඇත. කොමිසම වෙත යොමුකරන ලද අභියාචනා පාර්ලිමේන්තුව වෙත යොමුකරන ලද අභියාචනාවල ප්‍රතිශතයක් ලෙස ගතහොත් වැඩිම අගය වාර්තා වනුයේ 2019 වසරේදී වන අතර එය 30%ක අගයක් ගන්නා බව පෙනී යයි.


මේ දක්වා RTI කොමිසම විසින් ඕනෑම පොදු අධිකාරියකට එරෙහිව පවත්වන ලද අභියාචනා විභාග අතුරින් වැඩිම කාලයක් වැය කරන ලද අභියාචනා විභාගය ලෙස සැලකෙන්නේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ වත්කම් සහ බැරකම් ප්‍රකාශ මහජනතාවට නිකුත් කිරීම සම්බන්ධයෙන් පවත්වන ලද අභියාචනා විභාගයයි.

පාර්ලිමේන්තුව සම්බන්ධයෙන් තොරතුරු කොමිෂන් සභාව විසින් ලබා දුන් තීරණවලට එරෙහිව RTI පනතේ 34(1) වගන්තිය ප්‍රකාරව අභියාචනාධිකරණය වෙත යොමුකරන ලද අභියාචනා මේ දක්වා වාර්තා වී ඇත්තේ එක් අවස්ථාවක දී පමණක් වන අතර එය සිදුවී ඇත්තේ 2021 වසරේදීය.

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත හඳුන්වාදීම මගින් තොරතුරු ඉල්ලීමකට ප්‍රතිචාර වශයෙන් (reactive disclosure) තොරතුරු ලබාදීමේ ක්‍රමවේදයක් සකසා තිබුණත් පාර්ලිමේන්තු මහ ලේකම් කාර්යාලය විසින් එහි තොරතුරු පාර්ලිමේන්තු නිල වෙබ් අඩවිය වන (wwwparliamentlk) හරහා ප්‍රගාමීව (ඉල්ලීම් කිරීමකින් තොරව / (proactive) disclosure) මහජනතාවට ලබා දීම සඳහා ඉතාම සාධනීය පියවර රැසක් ගෙන ඇති බව සඳහන් කළ යුතුය.

ඊට අමතරව තොරතුරු ඒකකයේ කටයුතු පරිගණකගත කොට එය පාර්ලිමේන්තුවේ නිල වෙබ් අඩවිය සමඟ එක්කිරීම සඳහා පියවර ගනිමින් තිබෙන අතර ඒ තුළින් මහජනතාවට වඩා පහසුවෙන් පාර්ලිමේන්තුව මගින් ලබාදුන් තොරතුරු පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට හැකිවනු ඇත.

**සනත් විජේගුණවර්ධන**
**නියෝජ්‍ය ප්‍රධාන නිලධාරී**




විශේෂ ස්තුතිය:
**හිරුණි පුන්සරා**
**හැන්සාඩ් වාර්තාකරු**

**ශාන්ති සෞභාග්‍යා**
**සහකාර පර්යේෂණ නිලධාරී**






# ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීමේ අවශ්‍යතාවය

## ■ මහජන ගැටලුවලට පිළිතුරු සජීවීව පාර්ලිමේන්තු ට්විටර් Twitter අවකාශය ඔස්සේ

ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීමේ අවශ්‍යතාවය පිළිබඳ අධිකරණ බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගරු (ආචාර්ය) විජේදාස රාජපක්ෂ මහතා සහභාගී වන සජීවී ට්විටර් සාකච්ඡාව මේ මස 14 වැනිදා පෙරවරු 9.30 සිට 10.30 දක්වා පාර්ලිමේන්තුවේ නිල ට්විටර් ගිණුම @ParliamentLK ඔස්සේ පැවැත්විණි.

# පාර්ලිමේන්තුව සැකෙවින්...

## ඔක්තෝබර් 2022



මෙවර සටහන - **එච්. ඊ. ජනකාන්ත සිල්වා** - අධ්‍යක්ෂ (ව්‍යවස්ථාදායක සේවා)/ අධ්‍යක්ෂ (සන්නිවේදන) (වැඩබලන)

### ඔක්තෝබර්

### 2022.10.04

- ශ්‍රී ලංකාවේ ව්‍යාපාර පහසු කිරීමේ දර්ශකයේ අගය ඉහළ නැංවීම සම්බන්ධයෙන් පැන නැගී ඇති ප්‍රායෝගික ගැටලු හා දුෂ්කරතා අධ්‍යයනය කිරීමටත් ඒ පිළිබඳව සිය යෝජනා හා නිර්දේශ ඉදිරිපත් කිරීමටත් වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව පාර්ලිමේන්තුව විසින් යථා පරිදි සම්මත කරනු ලැබීම.

### 2022.10.05

- පාර්ලිමේන්තුවේ දැනට බලාත්මකව පවතින ස්ථාවර නියෝග පළමුවැනිවරට සංශෝධනය කිරීමේ යෝජනා පාර්ලිමේන්තුව විසින් යථා පරිදි සම්මත කරනු ලැබීම.

### 2022.10.07

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121 ව්‍යවස්ථාව ප්‍රකාරව අභියෝගයට ලක්කරන ලද "විෂ වර්ග අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන)" නමැති පනත් කෙටුම්පත පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය කථානායකවරයා විසින් පාර්ලිමේන්තුවට නිවේදනය කරනු ලැබීම.

### 2022.10.18

- 2023 මුදල් වර්ෂයට අදාළ "විසර්ජන" සහ "එකතු කළ අගය මත බදු (සංශෝධන)" නමැති පනත් කෙටුම්පත් ද්විත්වය පාර්ලිමේන්තුවට පිළිගන්වා පළමුවැනි වර කියවනු ලැබීම.
- "ඛනිජ තෙල් නිෂ්පාදන (විශේෂ විධිවිධාන) (සංශෝධන)" නමැති පනත් කෙටුම්පත දෙවැනි වර සහ තුන්වැනි වර කියවා පාර්ලිමේන්තුව විසින් සංශෝධිතාකාරයෙන් යථා පරිදි සම්මත කරනු ලැබීම.

### 2022.10.19

- "නොතාරිස් (සංශෝධන)" "ඇටෝනි බලපත්‍ර (සංශෝධන)" "ලේඛන ලියාපදිංචි කිරීමේ (සංශෝධන)" "අන්තිම කැමතිපත්‍ර (සංශෝධන)" සහ "වංචා වැළැක්වීමේ (සංශෝධන)" නමැති පනත් කෙටුම්පත් පහ දෙවැනි වර සහ තුන්වැනි වර කියවා පාර්ලිමේන්තුව විසින් සංශෝධිතාකාරයෙන් යථා පරිදි සම්මත කරනු ලැබීම.

## 2022.10.20

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121 ව්‍යවස්ථාව ප්‍රකාරව අභියෝගයට ලක්කරන ලද “පුනරුත්ථාපන කාර්යාංශය” නමැති පනත් කෙටුම්පත පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය කථානායකවරයා විසින් පාර්ලිමේන්තුවට නිවේදනය කරනු ලැබීම.
- “විසි දෙවැනි ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථා සංශෝධනය” නමැති පනත් කෙටුම්පත පිළිබඳ දෙවනවර කියැවීමේ විවාදය ආරම්භ කරනු ලැබීම.

## 2022.10.21


- “ඛනිජ තෙල් නිෂ්පාදන (විශේෂ විධිවිධාන) (සංශෝධන)” නමැති පනත් කෙටුම්පත පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාව ප්‍රකාරව කථානායකවරයා විසින් සහතිකය සටහන් කරනු ලැබීම.
- “දේශීය ආදායම් (සංශෝධන)” නමැති පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට පිළිගන්වා පළමුවැනි වර කියවනු ලැබීම.
- “විසි දෙවැනි ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථා සංශෝධනය” නමැති පනත් කෙටුම්පත දෙවැනි වර සහ තුන්වැනි වර කියවා පාර්ලිමේන්තුව විසින් සංශෝධිතාකාරයෙන් යථා පරිදි සම්මත කරනු ලැබීම.

## 2022.10.25

- ඇටෝර්නි බලපත්‍ර (සංශෝධන)” “අන්තිම කැමතිපත්‍ර (සංශෝධන)” සහ “වංචා වැළැක්වීමේ (සංශෝධන)” නමැති පනත් කෙටුම්පත් තුන පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාව ප්‍රකාරව කථානායකවරයා විසින් සහතිකය සටහන් කරනු ලැබීම.

## 2022.10.31

- “නොතාරිස් (සංශෝධන)” “ලේඛන ලියාපදිංචි කිරීමේ (සංශෝධන)” සහ “විසි එක්වැනි ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථා සංශෝධනය” නමැති පනත් කෙටුම්පත් තුන තුන පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාව ප්‍රකාරව කථානායකවරයා විසින් සහතිකය සටහන් කරනු ලැබීම.



පාර්ලිමේන්තු
ඡායා ගැලරිය












# පාර්ලිමේන්තු විත්ති

පුවත් හසුන I 28 වැනි කාණ්ඩය I ඔක්තෝබර් 2022
ISSN 2806 – 5425

සන්නිවේදන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

දුරකථනය : +94 11 2777100 ෆැක්ස් : +94 11 2777227

www.parliament.lk

Parliament of Sri Lanka

@ParliamentLK

@slparliament

Parliament of Sri Lanka